ජාතික ගමනාගමන කොමිෂන් සභාව
தேசிய போக்குவரத்து ஆணைக்குழு
NATIONAL TRANSPORT COMMISSION

241, උද්‍යාන පාර, කොළඹ 5.
241, பார்க் வீதி, கொழும்பு 5.
241, Park Road, Colombo 05.

මගේ අංකය / எனது இல. / My No.: NTC/QA/AD/ETF/2026
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2026.04.29

සියළුම මගී සේවා අවසරපත්‍ර හිමියන් වෙත කරනු ලබන දැනුම්දීමයි.

**<u>සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF) සඳහා දායක මුදල් ගෙවීම</u>**

ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ඔබ වෙත නිකුත් කර ඇති මගී සේවා අවසරපත්‍රයේ සඳහන් කොන්දේසි ප්‍රකාරව ඔබගේ මගී සේවා අවසරපත්‍රයට අනුයුක්ත කර ඇති බස්රථයේ සේවයේ නියුතු සේවක කණ්ඩායම සඳහා සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් ගෙවිය යුතු වේ.

ජාතික බස් ගාස්තු ප්‍රතිපත්තිය යටතේ බස් ධාවන පිරිවැය ගණනය කිරීමේදී ඉහත අරමුදල් සඳහා ගෙවිය යුතු මුදල අදාල පිරිවැයට ඇතුලත් කර ඇත.

එමෙන්ම කම්කරු කොමසාරිස්තුමා විසින් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සභාපති වෙත යොමු කරන ලද ලිපියට අනුව මගී සේවා අවසරපත්‍ර යාවත්කාලීන කිරීමේදී සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවා ඇති බවට කම්කරු දෙපාර්තමේන්තුව තහවුරු කළ වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරන ලෙස දන්වා ඇත.

ගරු ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා සමඟ පැවති සාකච්ඡාවේදී බස්රථ සේවක කණ්ඩායම් සඳහා අර්ථ සාධක අරමුදල් සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා දායක මුදල් ගෙවීමේ කටයුතු කඩිනමින් සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව ඔබගේ බස්රථයේ සේවය කරන සේවක කණ්ඩායම් සඳහා විධිමත් පත්වීම් ලිපියක් නිකුත් කර ඔවුන් වෙත සේවක අර්ථසාධක අරමුදල් සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් ගෙවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි. 2026.09.01 දින සිට මගී සේවා අවසරපත්‍ර යාවත්කාලීන කිරීමේදී ඉහත අරමුදල් සඳහා දායක මුදල් ගෙවා ඇති බවට කම්කරු දෙපාර්තමේන්තුවෙන් ලබාගත් වාර්තාවක් ඉදිරිපත් කිරීම අනිවාර්යය වන බව කාරුණිකව දන්වා සිටිමි.

ඔබගේ සේවක කණ්ඩායම්වල රැකියා සුරක්ෂිතතාවය හා සුභසාධන කටයුතු ඉහළ නැංවීම සඳහා ඔබ විසින් ලබා දෙන සහයෝගය ඉතා අගයකොට සලකමි.

ඉංජි.පී.ඒ.චන්ද්‍රපාල
සභාපති
ජාතික ගමනාගමන කොමිෂන් සභාව

පිටපත - අධ්‍යක්ෂ (ධාවන හා සේවා අධීක්ෂණ) - අවශ්‍ය කටයුතු සඳහා

දුරකථන / தொலைபேசி / Telephone

සභාපති / தலைவர் / Chairman : 2503680
කාර්යාලය / காரியாலயம் / Office : 2587372 (Hunting)
ෆැක්ස් / பக்ஸ் / Fax : 2503725, 2058138
ඊ මේල් / ஈ-மெயில் / E-mail : chairman@ntc.gov.lk

තොරතුරු හා පැමිණිලි / தகவலகளும் முறைப்பாடுகளும் / Information & Complaints : 1955, 2595555 (Hot Line)
ඊ මේල් / ஈ-மெயில் / E-mail : info@ntc.gov.lk
වෙබ් අඩවිය / வெப்சைட் / Website : www.ntc.gov.lk

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය    போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சு    Ministry of Transport and Highways

CamScanner